10-10-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ ඒකායන පියාගෙන් එක් උපදෙසක් ලබයි. එයට නොබෙදුනු උපදේශය යැයි කියයි. ඔබ දේවතාවන් බවට පත්වන්නේ, මෙම නොබෙදුනු උපදේශය පිළිපැදීමෙනි.

**ප්‍රශ්නය:** මෙම අවුල් ජාලය නම් ක්‍රීඩාවේ, මනුෂ්‍යයින්ට අමතක වී ඇති ප්‍රධාන කරුණ කුමක්ද?

**පිළිතුර:** අවුල් ජාලාවේ ක්‍රීඩාව තුළට යෑමෙන්, ඔවුන්ට නිවසට යන මාර්ගය අමතක වී ඇත. කවදා, කෙසේ නිවසට ආපසු යාමට හැකි වෙයිද කියා ඔවුන් නොදනී. පරම පියා දැන් පැමිණ සිටින්නේ ඔබ සැවොම ඔහුත් සමඟ ආපසු රැගෙන යාමටයි. දැන් ඔබගේ උත්සාහය වන්නේ, ශබ්දයෙන් එපිට මිහිරි නිවහනට යෑමටයි.

**ගීතය:** රාත්‍රියේ සංචාරකයාණෙනි, වෙහෙසට පත් නොවන්න! ඔබගේ සතුටෙහි දින, අත ළඟය!

ඕම් ශාන්ති. නාටකයේ සැලසුමට අනුව, වෙනත් කිසිවෙකුට ගීතයේ අරුත නොවැටහෙයි. පිටත මිනිසුන් විසින් රචනා කරන ලද ඇතැම් ගීත ඔබට උපකාරී වෙයි. ඔබ දේවතාවන් වන බව, ඔය දරුවන්ට දැන් වැටහෙයි. ලෞකික ඉගෙනුම් කරනා අය, ඔවුන් වෛද්‍යවරුන් හෝ නීතිඥයින් වන බව, කියන අන්දමින්, ඔබ නව ලෝකය සඳහා දේවතාවන් වන බව, ඔබගේ බුද්ධියේ ඇත. මෙම සිතිවිලි තිබෙන්නේ ඔබට පමණයි. නව ලෝකයට, ස්වර්ණමය යුගයට, අමරණීය දේශය යැයි කියයි. වර්තමානයේ, ස්වර්ණමය යුගයක් හෝ දේවතාවන්ගේ රාජධානියක් නැත එය මෙහි පැවතිය නොහැක. ඔබ චක්‍රය වටා ගොස්, කලි යුගයේ අවසානයට ළඟා වී ඇති බව ඔබ දන්නවා. චක්‍රය, වෙනත් කිසිවෙකුගේ බුද්ධිය තුළට ඇතුළු වන්නේ නැත. ස්වර්ණමය යුගයේ කාල වකවානුව, වසර සිය දහස් ගණනක් බව ඔවුන් කියයි. චක්‍රය සැබවින්ම බ්‍රමණය වන්නේ වසර 5000 කට වරක් යන විශ්වාසය ඔය දරුවන්ට තිබේ. මනුෂ්‍යයින් ගන්නේ උපත් 84 ක් පමණයි ගිණුම ඇත. මෙම දේවතා ධර්මයට, නොබෙදුනු ආගම යැයි කියයි. නොබෙදුනු ආගමික ග්‍රන්ථයද තිබේ ඒවායින් එකක් පමණයි තිබෙන්නේ. වෙනත් තැන්වල, නොගිණිය හැකි තරම් ආගම් සහ අසංඛ්‍ය ආගමික ග්‍රන්ථද තිබේ. ඔබ, එකක් පමණයි. ඔබට ඒකායන කෙනාගෙන් එක් උපදෙසක් පමණක් ලැබෙයි. මෙයට නොබෙදුනු උපදෙස යැයි කියයි. නොබෙදුනු උපදේශය ලැබෙන්නේ ඔබටයි. මෙම ඉගෙනුම, දේවතාවන් බවට පත් වීම සඳහාය. පරම පියාට ඥාන මහා සයුර සහ ඥානයෙන් සපිරි කෙනා යැයි කියන්නේ මේ නිසාය. පරමාත්ම දෙවියන් ඔබට නව ලෝකය සඳහා උගන්වන බව, ඔය දරුවන්ට වැටහෙයි. මෙය අමතක නොවිය යුතුයි. පාසැලක ශිෂ්‍යයින්ට ඔවුන්ගේ ගුරුවරයා අමතක වෙයිද? නැහැ. ඔවුන්ගේ පවුලේ අය සමඟ නිවෙස් වල වාසය කරන අය, වඩා හොඳ තත්ත්වයක් ලබා ගැනීම සඳහා, පාසැලට ගොස් ඉගෙනගනී. ඔබත් ඔබගේ පවුලේ අය සමඟ නිවසේ වාසය කරන අතර, ඉගෙනගන්නේ, දියුණු වීමටයි. ඔබ අසීමිත පියා සමඟ ඉගෙනගන්නා බව, ඔබගේ හදවතට ඇතුළු විය යුතුයි. ශිව බාබා, බාබා වන අතර, ප්‍රජාපිතා බ්‍රහ්මාත් බාබාය. ප්‍රජාපිතා බ්‍රහ්මා, ආදිදේව් යන නම බොහෝ සුප්‍රසිද්ධයි. අතීතයේ ගාන්දිජී පැවති ආකාරයෙන්ම ඔහුද අතීතයේ පැවතුණි. ඔවුන් ඔහුට බාපුජී (පියා) යැයි අමතන නමුත්, ඔහු එය බව ඔවුන් නොසිතයි ඔවුන් එය නිකමට පවසයි. ශිව බාබා සැබවින්ම එය වේ. බ්‍රහ්ම බාබාද එය වන අතර භෞතික පියෙක්ද සැබවින්ම එය වෙයි. කෙසේවෙතත්, ඔවුන් නගරයක නගරාධිපතිට 'පියා' ලෙසින් ආමන්ත්‍රණය කරන්නේ, නිකම් කියනවාට පමණයි. ඒ සියල්ලම කෘත්‍රිම වන අතර සැබෑ වන්නේ ඒකායන කෙනාය. පරම පියා, පරමාත්ම ජීවය පැමිණ, ජීවාත්මයන්ව, ප්‍රජාපිතා බ්‍රහ්මාගේ මාර්ගයෙන් ඔහු සතු කරගනී. ඔහුට අනිවාර්යෙන්ම බොහෝ දරුවන් ඇති. සියල්ලම ශිව බාබාගේ දරුවන්ය. සෑම කෙනෙක්ම ඔහු සිහිකරයි. කෙසේවෙතත්, ඇතැම් අය ඔහුව පිළිගන්නේවත් නැත. ඔවුන්, මෙම ලෝකය ඇති වූයේ සිතිවිල්ලකින් යැයි කියන, ස්ථිර අදේවවාදීන්ය. පරම පියා දැන් ඔබට විස්තර කර දෙයි ඔබ ඉගෙනගන්නා බවත්, ඔබට උගන්වන්නේ ශිව බාබා බවත්, ඔබගේ බුද්ධියේ තබාගන්න. මෙය දිවා රාත්‍රියේ සිහි කළ යුතුයි. මායා ඔබට නැවත නැවතත් අමතක කරවන්නේ මෙයයි. මේ නිසයි ඔබ බාබාව සිහිපත් කළ යුත්තේ. ඔබට තිදෙනාම අමතක වෙයි පියා, ගුරුවරයා සහ සත්ගුරුව. ඔහු එක්කෙනෙක් පමණක් වන නමුත් ඒ තිබියදී ඔබ ඔහුව අමතක කරයි. ඔබ රාවන සමඟ සටන් කරන්නේ මෙයටයි. පරම පියා පවසන්නේ ඕ ජීවාත්මයනි! ඔබ සතෝප්‍රධාන්ව සිටි අතර දැන් තමෝප්‍රදාන් වී ඇත. ඔබ සාම දේශයේ සිටි විට, පාරිශුද්ධ විය. පාරිශුද්ධත්වය නොමැතිව, කිසිම ජීවාත්මයකට උඩ ඉහළ සිටිය නොහැක. සියලුම ජීවාත්ම, පාරිශුද්ධකරු වන පරම පියාට කන්නලව් කරන්නේ මේ නිසාය. සෑම

කෙනෙක්ම අපවිත්‍ර සහ තමෝප්‍රධාන් වූ විට, පරම පියා පැමිණ මෙසේ පවසයි මා ඔබව සතෝප්‍රධාන් කරවනවා. ඔබ සියලු දෙනා, සාම දේශයේ සිටි විට, ඔබ පිවිතුරු විය. එහි කිසිම අපවිත්‍ර ජීවාත්මයකට සිටිය නොහැක. සෑම කෙනෙක්ම අනිවාර්යෙන්ම දඬුවම් විඳ, පිවිතුරු විය යුතුයි. පිවිතුරු නොවී කිසිම කෙනෙකුට ආපසු නිවහනට යෑමට නොහැක. අහවල් කෙනා බ්‍රහම් තත්ත්වයට මුසු වූ බව හෝ, අහවල් කෙනා ආලෝක පදාර්ථයට මුසු වූ බව කියා ඔවුන් පවසන නමුත්, ඒ සියල්ලම භක්ති මාර්ගයේ ඇති අසංඛේය අදහස්ය. මෙය ඔබගේ නොබෙදුනු උපදෙසයි. ඔබව මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය කළ හැක්කේ ඒකායන පියාට පමණය. පියා සෑම චක්‍රයකම ඔබට ඉගැන්වීමට පැමිණෙයි. ඔහුගේ රංගනය, පෙර චක්‍රයේදී සිදු වූ එම ආකාරයෙන්ම දිගටම සිදුවෙයි. මෙම නාටකය සදාතනිකව පෙර නියම වූවකි. ලෝක චක්‍රය අඛණ්ඩව බ්‍රමණය වෙයි. ස්වර්ණමය යුගය, රිදී යුගය, තඹ යුගය, කලි යුගය තිබෙන අතර ඉන්පසුව මෙම සංගම යුගය තිබේ. ප්‍රධානතම ආගම් වන්නේ දේවතා ධර්මය, ඉස්ලාම්, බෞද්ධ සහ ක්‍රිස්තියානිය. එනම්, රාජධානියක් තිබෙන අයයි. බ්‍රහ්මිණ්වරුන්ගේ හෝ කෞරවයන්ගේ රාජධානියක් නැත. ඔය දරුවන් දැන් නැවත නැවතත් අසීමිත පියාව සිහි කළ යුතුයි. ඔබට ලෞකික බ්‍රහ්මණයන්ටද විස්තර කළ හැක. බාබා ඔබට බොහෝ වාර ගණනාවක් කියා තිබේ පළමුව ඇත්තේ බ්‍රහ්මණ මුදුන් මල්කඩයි. බ්‍රහ්මාගේ පළමුවන පරම්පරාව ඔබයි. පිදුම් ලබන්නට සුදුසුව සිට, පසුව භක්ති මාර්ගයේදී පුදන්නන් බවට පත්වන්නේ ඔබ බව, ඔබ දන්නවා. ඔබ දැන් පිදුම් ලබන්නට සුදුසු අය බවට පත්වනවා. එම ලෞකික බ්‍රහ්මණයන්, සන්‍යාසීන් නොවෙයි, ගෘහවාසීන්ය. සන්‍යාසීන්, හත යෝගීන්ය ඔවුන් තම නිවෙස් අත්හරින ලෙස තමන්ටම බල කරගනී. හත යෝගීන් බොහෝ විවිධ යෝගා වර්ග උගන්වයි. ජායිපූර් වල හතයෝගීන්ගේ කලාගාරයක් තිබේ, නමුත් රාජයෝගාවේ පිළිරුවක් එහි නැත. රාජයෝගාවේ ප්‍රතිමා තිබෙන්නේ දිල්වාලා දේවාලයේ පමණයි. එහි කලාගාරයක් නැත. හතයෝගාවේ කලාගාර බොහොමයක් තිබේ. රාජයෝගාවේ දේවාල තිබෙන්නේ භාරතයේ පමණයි. මෙම කලාගාරය ජීවමාන ස්වරූපයේය. ඔබ මෙහි ජීවමාන ස්වරූපයෙන් අසුන් ගෙන සිටිනවා. දෙව්ලොව තිබෙන්නේ කොහෙද කියා මිනිසුන් නොදනී. දිල්වාලා දේවාලයේ ඔබ බිම තපස්යාවේ අසුන් ගෙන සිටින ආකාරය පෙන්වා තිබේ. එය ඔබගේ සම්පූර්ණ සිහිවටනයකි. දිව්‍ය ලෝකය පෙන්වා තිබෙන්නේ ඔබට ඉහළින්ය. මිනිසුන් විශ්වාස කරන්නේ දෙව්ලොව උඩ තිබෙන බවයි. මෙම චක්‍රය අඛණ්ඩව බ්‍රමණය වෙනවා. චක්‍රයෙන් භාගයකට පසුව, දිව්‍ය ලෝකය, පහළට යටට යන අතර පසුව චක්‍රයේ අවසානයේදී දිව්‍ය ලෝකය උඩට ඉහළට පැමිණෙයි. එහි කාල පරිච්ඡේදය කොපමණද කියා කිසිවෙකු නොදනී. පරම පියා ඔබට මුළු චක්‍රයම විස්තර කර ඇත. චක්‍රය අවසානයකට පැමිණෙන විට, ඔබ ඥානය ලබාගෙන ඉහළට යන අතර ඉන්පසුව චක්‍රය අළුතින් ආරම්භ වෙයි. ඔබ මෙය ඔබගේ බුද්ධිය තුළින් ආවර්ජනය කළ යුතුයි. ඒ මිනිසුන් දැනුම ඉගෙනගන්නා විට, ඔවුන්ගේ බුද්ධියේ ඔවුන්ගේ පොත් ආදිය තිබෙනවා නේද? මෙයත් ඉගෙනුමක්. මෙයින් ඔබව පුරවා තබාගන්න. ඔබ එය අමතක නොකළ යුතුයි. සෑම කෙනෙකුටම - මහළු, තරුණ සහ දරුවන්හට - මෙම ඉගෙනුම හැදෑරීමට අයිතියක් ඇත. ඔබට තිබෙන්නේ ඇල්ෆා ගැන දැනගැනීම පමණයි. ඔබ ඇල්ෆා දැනගැනීමෙන් පසුව, පරම පියාගේ දේපළ ඔබගේ බුද්ධිය තුළට ඇතුළු වෙයි. සත්වයින් පවා ඔවුන්ගේ දරුවන්ව තම බුද්ධියේ තබාගනී. ඔවුන් කැලය තුළට ගිය විට පවා ඔවුන්ගේ නිවස සහ කුඩා පැටවුන්ව දිගටම සිහිකරයි. ඔවුන් ඉබේටම ඔවුන්ගේ පැටවුන්ව සොයාගනී. පරම පියා දැන් පවසන්නේ නිරන්තරයෙන් මා පමණක් සිහිපත් කරන්න, එමෙන්ම එහි සිට ඔබගේ චරිත කොටස් රඟපෑමට ඔබ පැමිණි නිවහනද සිහි කරන්න. ජීවාත්ම තම නිවසට ආදරය කරයි. ඔවුන් බොහෝ සේ තම නිවස සිහිකරන නමුත් ඔවුන්ට ආපසු යන පාර අමතකව ගොසින්ය. ඔබ වාසය කරන්නේ බොහෝ ඈත බව, ඔබගේ බුද්ධිය තුළ ඇත. කෙසේවෙතත්, එහි යන්නේ කෙසේද හෝ ඔබට එහි යාමට නොහැක්කේ මන්ද කියා, කිසි කෙනෙක් නොදනී. අවුල් ජාලයේ ක්‍රීඩාව නිර්මාණය කර ඇත්තේ මේ නිසා බව, පරම පියා විස්තර කර ඇත ඔබ කුමන දිශාවකට ගියත් පිටවීමේ දොරටුව වසා ඇත. මෙම යුද්ධයට පසුව, දෙව්ලොව දොරටු විවෘත වන බව ඔබ දන්නවා. සෑම කෙනෙක්ම මෙම මරණීය දේශය හැර යයි. සෑම මනුෂ්‍යයෙක්ම ඔවුන්ගේ ආගමට අනුව සහ ඔවුන්ගේ චරිත කොටසට අනුව, අංක පිළිවෙලට එහි ගොස් එහි සිටියි. මේ සෑම දෙයක්ම ඔබගේ බුද්ධිය තුළ ඇත. බ්‍රහම් තත්ත්වයට යෑමට මිනිසුන් බොහෝ සේ වෙර දරයි. ඔබ ශබ්දය ඉක්මවා යා යුතුයි. ජීවාත්මයක් ඔහුගේ සිරුර අත්හළ විට, හඬක් ඉතිරි වන්නේ නැත. මෙය ඔබගේ මිහිරි නිවස බව ඔය දරුවන් දන්නවා. තවද මිහිරි රාජධානිය, දේවතාවන්ගේ නොබෙදුනු රාජධානියද තිබේ. පරම පියා පැමිණ ඔබට රාජයෝගාව උගන්වයි. ඔහු ඔබට සම්පූර්ණ ඥානය විස්තර කරන අතර, පසුව භක්ති මාර්ගයේ ආගමික ග්‍රන්ථ නිර්මාණය වන්නේ එයින්ය. ඔබට දැන් එම ආගමික ග්‍රන්ථ හැදෑරීමට අවශ්‍ය නැත. මහළු මව්වරුන් එම පාසැල් වල ඉගෙනගන්නේ නැත. මෙහි සෑම කෙනෙක්ම ඉගෙනගනී. ඔය දරුවන් අමරණීය දේශයේ දේවතාවන් බවට

පත්වෙයි. එහි අපහාසාත්මක වචන කිසිවක් පැවසෙන්නේ නැත. අතීතයේ දිව්‍ය ලෝකය පැවතුණු බව ඔබ දැන් දන්නවා. දිව්‍ය ලෝකයේ ප්‍රශංසාව තිබේ. ඔවුන් බොහෝ දේවාල තනයි. ඔවුන්ගෙන් විමසන්න ලක්ෂ්මී සහ නාරායන් අතීතයේ පැවතුණේ කවදාද? ඔවුන් කිසිම දෙයක් දන්නේ නැත. ඔබ දැන් ආපසු නිවසට යා යුතු බව ඔබ දන්නවා. 'හම් සෝ'හි අරුත 'ඕම්'හි අරුතට වඩා වෙනස් බව, ඔය දරුවන්ට පැහැදිලි කර දී ඇත. ඔවුන් 'ඕම්'හි අරුත සහ 'හම් සෝ'හි අරුත එකක් බවට පත් කර තිබේ. ඔය ජීවාත්ම සාම දේශයේ වැසියන්ය. ඔබ මෙහි පහළට පැමිණෙන්නේ ඔබගේ චරිත කොටස් රඟපෑමටයි. ඔබ දේවතාවන්, සටන්කාමීන්, වෙළෙන්දන් සහ ශුද්‍රයින් බවට පත්වෙයි. 'ඕම්' යනු, 'මම ජීවාත්මයක්.' විශාල වෙනසක් තිබේ! ඔවුන් දෙකෙහිම අරුත, එකක් ලෙස ගෙන ඇත. මෙම කරුණු බුද්ධියෙන් වටහාගත යුතුයි. සම්පූර්ණයෙන්ම වටහා නොගන්නා අය, සෑම විටෙකම දිගින් දිගටම නිදි කිරා වැටෙයි. කෙනෙක් ආදායමක් උපයන විට, කිසි විටෙක නිදි කිරා වැටෙන්නේ නැත. එම ආදායම තාවකාලික කාලයකට පමණයි. මෙම ආදායම චක්‍රයෙන් භාගයකටයි. කෙසේවෙතත්, ඔබගේ බුද්ධිය වෙනත් දිශාවන්හි සැරිසරන විට, ඔබ වෙහෙසට පත් වී ඈනුම් අරින්න පටන් ගනී. ඔබ මෙහි ඇස් වසා, අසුන් ගෙන නොසිටිය යුතුයි. ජීවාත්ම අවිනාශී බවත් ශරීර විනාශ වන බවත් ඔබ දන්නවා. කලි-යුගී අපායේ වැසියන් සෑම දෙයක් දෙස බලන ආකාරය සහ ඔබ සෑම දෙයක් දෙස බලන ආකාරය අතර, දිවා රාත්‍රියේ මෙන් වෙනසක් තිබේ. ජීවාත්මය වන මා, පරම පියා සමඟ ඉගෙනගන්නවා. පරම පියා, පරමාත්ම ජීවය, ඥාන මහා සාගරය, අපට ඉගැන්වීමට පැමිණෙන බව, කිසි කෙනෙක් නොදනී. ජීවාත්මය වන මා, ඔහුට සවන් දෙනවා. තමන් ජීවාත්මයක් බව සලකා, පරම පියාව සිහිකිරීමෙන් පමණයි, ඔබගේ පාපයන් දුරුවන්නේ. ඔබගේ බුද්ධිය උඩට ඉහළට යයි. ශිව බාබා මෙම ඥානය පවසන්නේ අපටයි. මේ සඳහා බොහෝ පිරිපහදු වූ බුද්ධියක් අවශ්‍යයි. ඔබගේ බුද්ධි පිරිපහදු කරගැනීමේ ක්‍රමය බාබා පෙන්වා දෙයි. තමන් ජීවාත්ම බව සැලකීමෙන්, ඔබ අනිවාර්යෙන්ම පරම පියාව සිහි කරයි. ඔබ, තමන් ජීවාත්ම බව සැලකිය යුතු හේතුව වන්නේ, එවිට ඔබට පරම පියාව සිහි කිරීමට හැකි වන අතර, මුළු චක්‍රයටම බිඳී ඇති එම සම්බන්ධතාවය ඔබට ඇති කළ හැකි නිසයි. එහි තිබෙන්නේ සතුටෙහි ප්‍රතිලාභයයි, සතුටම පමණයි එහිදී දුකක් පිළිබඳ ප්‍රශ්නයක් නැත. එයට කියන්නේ දෙව්ලොව කියාය. ඔබව දිව්‍ය ලෝකයේ අධිපතියන් බවට පත් කරවන්නේ දිව්‍යමය දෙව් පියාණන් පමණයි. ඔබ එවන් පියෙක්වත් අමතක කරයි! පරම පියා පැමිණ ඔය දරුවන්ව දරුකමට හදාගනී. මාරවරි කුලයේ අය, බොහෝ දරුවන්ව දරුකමට හදාගනී. ඔවුන් ධනවත් අයගේ උකුලට ගොස් ඇති නිසා, ඔවුන් බොහෝ සතුටු වෙයි. ධනවත් අයගේ දරුවන්ව, දුප්පතුන් කිසිදාක දරුකමට හදාගන්නේ නැත. ඔබ ප්‍රජාපිතා බ්‍රහ්මාගේ දරුවන්ය. එබැවින් ඔබ නිසැකයෙන්ම මුඛයෙන් උපන් නිර්මාණයක්ය. බ්‍රහ්මණයන් වන ඔබ, මුඛයෙන් උපන් නිර්මාණයකි. අර නිර්මාණය උපදින්නේ විෂ තුළිනි. ඔබට මෙහි වෙනස වැටහෙයි. ඔබ ඔවුන්ට විස්තර කළ විට පමණයි, ඔවුන්ට මුඛයෙන් උපන් නිර්මාණයක් වීමට හැකි වන්නේ. මෙය දරුකමට හදාගැනීමක්. සැමියෙක් ඔහුගේ භාර්යාව, ඔහුට අයත් බව සලකයි. භාර්යාව නිර්මාණය වන්නේ විෂ තුළින්ද මුඛය තුළින්ද? භාර්යාව, මුඛයෙන් උපන් නිර්මාණයකි. පසුව, ඔවුන්ට දරුවන් සිටින විට, එම දරුවන් උපදින්නේ විෂ තුළිනි. පරම පියා පවසන්නේ ඔබ සියල්ලන්ම මුඛයෙන් උපන් නිර්මාණයකි. 'ඔබ මගේ' යැයි කීමෙන්, ඔබ මට අයිති, නොවේද? මෙසේ කීමෙන් 'මේ මාගේ දරුවන් ', කුල්මත්භාවය ඉහළ නඟී. එබැවින් ඔබ සියලු දෙනාම මුඛයෙන් උපන් නිර්මාණයකි. ජීවාත්ම, මුඛයෙන් උපන් නිර්මාණයක් නොවෙයි. ජීවාත්ම, සදාතනික මෙන්ම අවිනාශීය. මනුෂ්‍ය ලෝකය මාරු වන්නේ කෙසේද කියා ඔබ දන්නවා. ඔය දරුවන්ට බොහෝ කරුණු ලැබී තිබේ. කෙසේවෙතත්, බාබා පවසන්නේ ඔබට කිසි දෙයක් ධාරණය කරගැනීමට හෝ පැවසීමට නොහැකි වුවත්, පරම පියාව සිහිපත් කරන්න එපමණයි, එවිට ඔබට දේශන ලබා දෙන අයට වඩා ඉහළ තත්ත්වයක් හිමි කරගැනීමට හැකි වෙයි. ඇතැම් විට, දේශන ලබා දෙන අය වුවද, කුණාටු නිසා ඇද වැටෙයි. කෙසේවෙතත්, ඔවුන් නොවැටී දිගටම පරම පියාව සිහිපත් කරන්නේ නම්, ඔවුන්ට උසස් තත්ත්වයක් හිමි කරගත හැක. වැඩියෙන්ම පාපයේ ගැලෙන අයගේ සියලුම අස්ථි බිඳී යයි, මන්ද එය පස්වෙනි මහලෙන් බිමට වැටෙන්නා සේය. පස්වෙනි මහල වන්නේ ශරීර අවධානය වන අතර, රාගය හතර වෙනි මහලද, මේ අන්දමින් දිගින් දිගටම යයි... පරම පියා පවසන්නේ විශාලතම සතුරා වන්නේ රාගයයි. සමහර දරුවන් ලියන්නේ බාබා, මා වැටී ඇත. ඔවුන් වැටී ඇත්තේ කෝපය නිසා නොවෙයි. කෙනෙක් තම මුහුණ කිලිටි කරගත් විට, ඔහු බොහෝ සේ තමන්ට හානි සිදුකරගනී. රාගය විශාලතම සතුරා බව, ඔහුට අන් අයට කීමට නොහැකි වෙයි. බාබා නැවත නැවතත් පවසන්නේ සාපරාදී ඇස් ගැන බොහෝ ප්‍රවේසම් වන්න. ස්වර්ණමය යුගයෙදී, නිරුවත් කිරීම ගැන ප්‍රශ්නයක් නැත. සාපරාදී ඇස් නොමැත. එය ශිෂ්ඨ (ශිෂ්ඨ සම්පන්න) රාජධානියයි. මෙකල, ලෝකය සාපරාදීය. ඔය ජීවාත්මයන්ට දැන් ශිෂ්ඨ ඇස් ලැබී ඇති අතර, ඒවා උපත් 21 කට ක්‍රියාත්මක වෙයි.

එහි කිසිවෙක් සාපරාදී වන්නේ නැත. පරම පියා ප්‍රධානතම දෙය විස්තර කරයි පරම පියාව සහ උපත් 84 හි චක්‍රය සිහිපත් කරන්න. ශ්‍රී නාරායන් වන කෙනා, අවසානයේදී භාග්‍ය රථය වීම, ආශ්චර්යයක්. පරම පියා ඔහු තුළට ඇතුළු වෙයි. එබැවින් ඔහු බොහෝ භාග්‍යවන්ත වෙයි. බ්‍රහ්ම, විෂ්ණු වන ආකාරය සහ විෂ්ණු, බ්‍රහ්ම වන ආකාරයේ උපත් 84 හි ඉතිහාසය ඔබගේ බුද්ධිය තුළ තිබිය යුතුයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පරම පියාගේ සිහිපත් කිරීම තුළින් ඔබගේ බුද්ධිය පිරිපහදු කරගන්න. සෑම විටෙකම මෙම ඥානයෙන්, ඔබගේ බුද්ධිය පුරවා තබන්න. නිරන්තරයෙන් පරම පියාව සහ නිවහන සිහිපත් කර, අන් අයටද එය සිහි කරවන්න.
2. මෙම අවසන් උපතෙදී ඔබගේ සාපරාදී දෑස අවසන් කර, ඒවා ශිෂ්ඨ කරගන්න. සාපරාදී දෑස ගැන බොහෝ ප්‍රවේසමින් සිටින්න.

**වරදානය:** ඉඩ දීමේ බලයෙන් දානපතියෙකුගේ ස්ථිතිය තිබීමෙන්, ඔබ නිරන්තරයෙන් බාධක විනාශ කරන්නෙක් සහ විසඳුම් වල ප්‍රතිමූර්තියක් වේවා.

බාධක විනාශ කරන්නෙක් සහ විසඳුම් වල ප්‍රතිමූර්තියක් වීමේ ආශිර්වාදය, ඔබ කාරණා දෙකක පදනමට අනුව ලබයි: 1) ඔබ දානපතිගේ දරුවෙක් බවත් ඔබ සියලු දෙනාටම ලබා දිය යුතු බව නිරන්තරයෙන් අවධානයේ තබා ගැනීම. ඔබට ගෞරවය හෝ සෙනෙහස ලැබුණු විට ඔබ ආදරණීය වනවා නොවේ. ඔබ ලබා දිය යුතුයි. 2) තමන්ට සහ ඔබ සමග නෑ සම්බන්ධතාවයක් ඇති සියලු දෙනාටම ඉඩ දීමේ බලයේ සාගරයක් වන්න. මෙම විශේෂතා දෙක තිබීමෙන් ඔබ සුබ පැතුම් සහ පිවිතුරු හැඟීම් වලින් පිරිපුන් වී විසඳුම් වල ප්‍රතිමූර්තියක් වෙයි.

**පාඨය:** සත්‍යය ඔබගේ සහකරු කරගන්න, එවිට ඔබගේ ඔරුව කිසිදා නොගිලෙයි.

***** ඔම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: යෝගා බලයෙන් ඔබගේ මනසින් තමන් මත සහ අන් අය මත පර්යේෂණ සිදු කරන්න.**

ඔබේ මනසින් සුබ පැතුම් සහ මංගල්‍ය ආශීර්වාද ලබා දීමේ ස්වභාවික පුහුණුව ඔබ සතුව ඇති විට, ඔබේ මනස කාර්යබහුලව රැඳී සිටින අතර ඒ තුළ සිදුවන ඕනෑම කැලඹීමකින් නිරායාසයෙන්ම ඉවත් වනු ඇත. එවිට ඔබ සමහර විට දැන් කරන පරිදි ඔබේ උත්සාහයන් පිළිබඳ කිසි විටෙකත් අධෛර්යමත් නොවනු ඇත. එහි ආශ්චර්යයක් තිබෙනු ඇත.